සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016
# බුද්ධ ධර්මය - I

10 ශ්‍රේණිය | කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි :
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

01. සිදුහත් කුමරු ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගත්තේ,

(1) භාර්ගව බමුණාගෙනි. (2) තිවංක බමුණාගෙනි.
(3) කාලදේවල බමුණාගෙනි. (4) සර්වමිත්‍ර බමුණාගෙනි.

02. ''මෙවන් පුතෙකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති. මෙවැනි ස්වාමියෙක් ඇති බිරිය ද නිවීම ලැබ සිටින්නියකි.'' යනාදී වශයෙන් නිබ්බුත පද කියන ලද්දේ

(1) යසෝදරා දේවිය විසිනි. (2) මහාමායා දේවිය විසිනි.
(3) කිසාගෝතමිය විසිනි. (4) සුජාතා සිටු දියණිය විසිනි.

03. ''අරඹව්, නික්මෙව්, යෙදෙව් බුදු සසුන්හි, දිනව් මරසෙන් පරදා බට කැලයට වැදි අතෙකු සේ'' යන අදහස දෙන සූත්‍රය වන්නේ

(1) මංගල සූත්‍රයයි. (2) වනරෝප සූත්‍රයයි. (3) පරිනිබ්බාණ සූත්‍රයයි. (4) අරුණවතී සූත්‍රයයි.

04. තෙරුවණෙහි සූවිසි ගුණ වශයෙන් දක්වනු ලබන්නේ

(1) ගුණ හයකි. (2) ගුණ නවයකි. (3) ගුණ දොලහකි. (4) ගුණ විසිහතරකි.

05. බුදුරජාණන් වහන්සේ පංච නීවරණ ධර්ම අතුරින් පාට කළ වතුරට උපමා කරන්නේ,

(1) ව්‍යාපාදයයි. (2) කාමඡන්දයයි. (3) විචිකිච්ඡාවයි. (4) ථීනමිද්ධයයි.

06. සිදුහත් බෝසතාණෝ කිං කුසල ගවේසීව සිටි සමයේ දී හමු වූ සප්ත සමාපත්ති ලාභියෙකු වූයේ,

(1) ආලාරකාලාම ය. (2) උද්දකරාමපුත්ත ය. (3) භාර්ගව ය. (4) උපක ය.

07. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයක් නොවන්නේ,

(1) මුණිගුණාලංකාරයයි. (2) බුදුගුණාලංකාරයයි.
(3) සාරාර්ථ සංග්‍රහයයි. (4) සතර බණවර සන්නයයි.

08. දුටුගැමුණු රජු විසින් ඉදි කරන ලද මහා සෑයට පමණක් දෙවෙනි වන අසිරිමත් ගොඩනැගිල්ලක් වන්නේ,

(1) පංචාවාසයයි. (2) රත්න ප්‍රාසාදයයි.
(3) ලෝවා මහා ප්‍රාසාදයයි. (4) ආලාහන පිරිවෙනයි.

09. සීලයෙහි පිහිටා කටයුතු නොකළ නිසා උපයාගත් ධනය අහිමි කොට ගෙන ඉන බැඳී වතට පමණක් සීමා වූ සිටු පුත්‍රයෙකු වන්නේ,

(1) මහධන සිටුපුත්‍රයා ය. (2) කාල සිටුපුත්‍රයා ය.

(3) මිගාර සිටුපුත්‍රයා ය. (4) අනේපිඬු සිටුපුත්‍රයා ය.

10. බුදුරජාණන් වහන්සේ ඒ ඒ සමාජ කොටස් අතර ඉටු විය යුතු යුතුකම් පිළිබඳ විස්තර කර ඇති සූත්‍රය වන්නේ,

(1) කරණීයමෙත්ත සූත්‍රයයි. (2) සිගාලෝවාද සූත්‍රයයි.

(3) අග්ගඤ්ඤ සූත්‍රයයි. (4) පරිනිබ්බාණ සූත්‍රයයි.

11. ''වෛර කරන්නවුන් අතර වෛර නොකර අපි සුවසේ වසන්නෙමු. අවෛරීව ජීවත් වන්නෙමු. රාගාදී කෙලෙස් නිසා රෝගී වූ මිනිසුන් අතර අපි කෙලෙස් ලෙඩ නොමැතිව සුවසේ වසන්නෙමු. පස්කම් සැප සෙවීමෙහිව උනන්දුවන්නන් අතර අපි එබඳු උනන්දුවකින් තොරව සුවසේ ජීවත් වන්නෙමු. උත්සුක මිනිසුන් අතර අනුත්සුකව වාසය කරන්නෙමු...'' මෙසේ ප්‍රකාශ කරන ලද්දේ,

(1) උපක ආජීවකයා ය. (2) ද්‍රෝණ බමුණා ය.

(3) බුදුරජාණන් වහන්සේ ය. (4) අස්සජි තෙරුන් වහන්සේ ය.

12. බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රයේ දී දකුණු දිසාවෙන් දක්වා ඇති සමාජ කණ්ඩායම වන්නේ,

(1) ගුරුවරුන් ය. (2) මවුපියන් ය. (3) අඹුදරුවන් ය. (4) පැවිදි උතුමන් ය.

13. පෞද්ගලික සංවර්ධනයට පමණක් නොව සමාජ සංවර්ධනයට ද එකසේ බාධා පමුණුවන විකෘති සිත් හා විකෘති හැසිරීම් මෙන්ම විකෘති බස්වලින් ද යුත් පිරිසක් සමාජයේ බහුලව දක්නට ඇත. මොවුන්ගේ විකෘතිභාවයට හේතුව වන්නේ,

(1) නොකල්හි වීථි සංචාරයයි. (2) මත්ද්‍රව්‍ය භාවිතයයි.

(3) සුදුසු ප්‍රදේශයක නොවිසීමයි. (4) සම වයස් කණ්ඩායම් හා එක්වීමයි.

14. දුගී පවුලක උපත ලැබුවද ඉහල මට්ටමේ රූප සෝබාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට හේතු විය හැක. මේ සඳහා හේතුව වන්නේ,

(1) ගති සම්පත්තියයි. (2) උපධි සම්පත්තියයි.

(3) කාල සම්පත්තියයි. (4) ප්‍රයෝග සම්පත්තියයි.

15. 'අභිධ්‍යාව' දස අකුසල කර්මවලින් එකකි. එය අයත් වන්නේ,

(1) කාය කර්මවලට ය. (2) වචී කර්මවලට ය.

(3) මනෝ කර්මවලට ය. (4) ගරුක කර්මවලට ය.

16. විපාක දීමට ඉදිරිපත් වන අනුපිළිවෙල අනුව කර්මය බෙදා දක්වීමේ දී ජීවිතයේ නිතර නිතර පුරුදු පුහුණු කරනු ලැබූ කර්ම හඳුන්වන්නේ.

(1) ගරුක කර්ම ලෙස ය. (2) ආසන්න කර්ම ලෙස ය.

(3) කටත්තා කර්ම ලෙස ය. (4) ආචින්න කර්ම ලෙස ය.

17. කෙනෙකු දේවත්වයට උසස් කරවන ගුණධර්ම දේවධර්ම වේ. එම දේවධර්ම නම්,

(1) ලැජ්ජාව සහ භයයි. (2) කර්මය සහ පුනර්භවයයි.

(3) කුසල් හා අකුසල් ය. (4) පිං සහ පව් ය.

18. බුදුදහමේ මූලික ඉගැන්වීම් අතර ත්‍රිලක්ෂණයට ප්‍රධාන තැනක් හිමි වේ. ඒ අනුව ත්‍රිලක්ෂණය යනු,

(1) ශාරීරික, පාරිභෝගික, උද්දේසික ය. (2) සීල, සමාධි, ප්‍රඥා ය.

(3) සුඛ, දුක්ඛ, උපෙක්ඛා ය. (4) අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ය.

19. ''ඔබ වහන්සේ පැවිදි වූයේ කවරෙකු උදෙසා ද? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක් ද? ඔබ වහන්සේ රුචි කරන්නේ කාගේ දහමක් ද?'' යනුවෙන් අසන ලද්දේ,

(1) සංජය පිරිවැජියා ය. (2) කෝලිත පිරිවැජියා ය.

(3) උපතිස්ස පිරිවැජියා ය. (4) උපක ආජීවකයා ය.

20. ''ඉමස්සා නිරෝධා ඉදං නිරුජ්ඣති'' යන පාඨයෙහි අදහස නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.

(1) මෙය නැති කල්හි මෙය නොවේ. (2) මෙය නැති වී යාමෙන් මෙය නැතිව යයි.

(3) මෙය නැති කල්හි මෙය නොවේ. (4) මෙය ඉපදීමෙන් මෙය උපදී.

21. බුදුරජාණන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි දී පස්වග තවුසන් අමතා දේශනා කළ සූත්‍රය වන්නේ,

(1) මහා මංගල සූත්‍රයයි. (2) කරණීයමෙත්ත සූත්‍රයයි.

(3) අනත්ත ලක්ඛන සූත්‍රයයි. (4) ධම්මචක්කපවත්තන සූත්‍රයයි.

22. සංඛාර දුක්ඛතා නම්,

(1) වෙනස් වීමේ දුක ය. (2) සාමාන්‍ය දුක ය.

(3) සංසාරයේ ඇතිවන දුක ය. (4) ඇතිවීම නැතිවීම හේතුවෙන් හට ගන්නා දුක ය.

23. පංචස්කන්ධය යනු,

(1) පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාශ ය. (2) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාන ය.

(3) රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ය. (4) චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය ය.

24. අංග අටකින් යුත් ආර්ය මාර්ගය අයත් වන්නේ,

(1) දුක්ඛාර්ය සත්‍යට ය. (2) දුක්ඛ සමුදයාර්ය සත්‍යට ය.

(3) දුක්ඛ නිරෝධාර්ය සත්‍යට ය. (4) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාර්ය සත්‍යට ය.

25. ලෙහෙණුන්ගේ අභය භූමියක් වූ කලන්දක නිවාප නම් ස්ථානයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය වන්නේ,

(1) මහා මොග්ගල්ලාන සූත්‍රයයි. (2) මහා සීහනාද සූත්‍රයයි.

(3) සාමඤ්ඤඵල සූත්‍රයයි. (4) ධනීය ගෝපාල සූත්‍රයයි.

26. බුදුරජාණන් වහන්සේ හයවන වස්කාලය ගත කළේ,

(1) පාරිලෙය්‍ය වනයෙහි ය. (2) මකුල පර්වතයෙහි ය.

(3) බරණැස ඉසිපතන මිගදායෙහි ය. (4) කූටාගාර ලෙනෙහි ය.

27. 'ආරෝග්‍ය පරමා ලාභා සන්තුට්ඨී පරමං ධනං

විස්සාස පරමා ඤාති නිබ්බාණ පරමං සුඛං'

යන ධම්මපද ගාථාව අයත් වග්ගය වන්නේ,

(1) බුද්ධ වග්ගයයි. (2) යමක වග්ගයයි. (3) සුඛ වග්ගයයි. (4) අප්පමාද වග්ගයයි.

28. ශ්‍රී ලාංකිය ශාසන ඉතිහාසයේ පළමුවරට පෞද්ගලික ආරාම පූජාවක් සිදු කළේ,

(1) දුටුගැමුණු රජතුමා ය. (2) දේවානම්පියතිස්ස රජතුමා ය.

(3) මහසෙන් රජතුමා ය. (4) වළගම්බා රජතුමා ය.

29. එංගලන්තයේ පාලි පොත් සමාගම පිහිටුවා පාලි පොත් ඉංග්‍රීසි බසට පරිවර්තනය කිරීමට කටයුතු කළේ,

(1) ආනන්ද කුමාරස්වාමි මැතිතුමා ය. (2) ගයිගර් මැතිතුමා ය.

(3) මැක්ස්මුලර් මැතිතුමා ය. (4) රිස් ඩේවිඩ්ස් මැතිතුමා ය.

30. මෙම රූපයෙන් දැක්වෙන්නේ,



(1) අනුරාධපුර බිසෝ මාලිගාවයි.
(2) පරාක්‍රමබාහු මාලිගාවයි.
(3) පොළොන්නරු වටදාගෙයයි.
(4) තිවංක පිළිමගෙයයි.

31. ස්තූපයේ අලංකාරය හා ආරක්ෂාව සඳහා තොරණක ආකාරයෙන් සතර දිශාවේ ඉදි කළ ශ්‍රී ලංකාවේ ස්තූපවලට පමණක් ආවේණික නිර්මාණය වන්නේ,
(1) වටදාගෙයයි. (2) ආයකයි. (3) පියගැට පෙළයි. (4) කොරවක්ගලයි.

32. ''සද්ධර්මය නමැති මිණිකැට ඇමුණූ මාලය'' යන අර්ථයෙන් පාලි ධම්මපදට්ඨ කතාව ඇසුරු කරගෙන රචනා කළ ග්‍රන්ථය වන්නේ,
(1) අමාවතුරයි. (2) බුත්සරණයි. (3) සද්ධර්මරත්නාවලියයි. (4) ධර්ම ප්‍රදීපිකාවයි.

33. බුදුරජාණන් වහන්සේගේ පුරිස ධම්ම සාරථී ගුණය පදනම් කර ගෙන අමාවතුර කෘතිය රචනා කරන ලද සාහිත්‍ය යුගය වන්නේ,
(1) පොළොන්නරු සාහිත්‍ය යුගයයි. (2) අනුරාධපුර සාහිත්‍ය යුගයයි.
(3) කුරුණෑගල සාහිත්‍ය යුගයයි. (4) දඹදෙණි සාහිත්‍ය යුගයයි.

34. සත්ත්වයාගේ සසර දුක ඇතිවීම හා නැති කිරීම පෙන්වා දීමට බුදුරජාණන් වහන්සේ උපයෝගී කර ගත්තේ,
(1) පුබ්බේකත හේතුවාදයයි. (2) අනාත්මවාදයයි.
(3) පටිච්ච සමුප්පාදයයි. (4) අහේතු අප්‍රත්‍යයවාදයයි.

35. සප්ත අපරිහානිය ධර්මවලට අයත් නොවන්නේ,
(1) විවාහ නොවූ කුල කුමරියන්ට ආරක්ෂාව සැලසීමයි.
(2) වැඩිහිටියන්ට ගරු කිරීමයි.
(3) නිතර නිතර රැස්වීමයි.
(4) සියලු රටවැසියන් තම දරුවන් සේ සැලකීමයි.

36. සතර අගතියට අයත් නොවන්නේ,
(1) ඡන්දයයි. (2) මෝහයයි. (3) මුදිතායි. (4) භයයි.

37. අරුණ වාසය කළ ප්‍රදේශය අතිශයින් නාගරික විය. එය නොහොබිනා ක්‍රියාකාරකම් ඇති පුද්ගලයන්ගෙන් ගහණ වූ පරිසරයකි. ඇසුරු කිරීමට පවා පුද්ගලයෙක් නොසිටී. අරුණ ගත කළේ සදාචාර සම්පන්න දිවියකි. මෙයින් පැහැදිලි කරන ජීවන දර්ශනය වන්නේ,
(1) ධාර්මිෂ්ඨ ජීවිතයයි. (2) කාරුණික ජීවිතයයි.
(3) සාමකාමී ජීවිතයයි. (4) පද්මාකාර ජීවිතයයි.

38. දස සක්විතිවත්වල නවවන කරුණ වන්නේ,
(1) දිළිඳු ජනයාට ධනය දෙන්න යන්න ය.
(2) තිරිසනුන්ට හා පක්ෂීන්ට ධාර්මික රැකවරණය සලසන්න යන්න ය.
(3) සිල්වත්, ගුණවත්, වියත් මහණ බමුණන්ගෙන් අවවාද අනුශාසනා ලබා ගනිමින් රට පාලනය කරන්න යන්න ය.
(4) රටේ අධාර්මික ක්‍රියා ඇති නොවන අයුරින් කටයුතු කරන්න යන්න ය.

39. බුදුගුණ දනියි. එහි සිත බැඳී පවතී. දහම් ගුණ දකියි. එහි සිත බැඳී පවතී. සඟ ගුණ දකියි. එහි සිත බැඳී පවතී. එවිට ඔහුගේ හෝ ඇයගේ සිත තුළ වැඩෙන්නේ,
(1) ශ්‍රැතියයි. (2) ශ්‍රද්ධාවයි. (3) ප්‍රඥාවයි. (4) චාගයයි.

40. පාලි බෝධිවංශය පදනම් කර ගනිමින් රචනා කරන ලද ග්‍රන්ථය වන්නේ ධර්මප්‍රදීපිකාවයි. එය රචනා කරන ලද්දේ,
(1) විද්‍යාචක්‍රවර්තී පඬිවරයා ය. (2) ධර්මසේන හිමියන් ය.
(3) ගුරුළුගෝමී පඬිවරයා ය. (4) බුද්ධපුත්‍ර හිමියන් ය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2016

**10 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි ඃ
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

(01) කෙටි පිළිතුරු සපයන්න.

i. බුදුරජාණන් වහන්සේට පූජා කළ මුල්ම ආරාමය කුමක් ද? එය පූජා කළේ කවුරුන් විසින් ද?

ii. බුදුරජාණන් වහන්සේ විසින් සිගාලෝවාද සූත්‍රයේදී පෙරදිගට (නැගෙනහිර) හා දකුණු දිගට උපමා කළේ කවුරුන් ද?

iii. 'නිවන' යන පදයෙහි කෙටි අදහස ලියන්න.

iv. ''භාවේති කුසල ධම්මේ ආසේවති වඩ්ඪේති ඒකායතාති භාවනා'' මෙම පාඨයේ අර්ථය ලියන්න.

v. පංච මහා විලෝකනය යනු කුමක් ද?

vi. මෙත් වැඩීමෙන් ලැබෙන ආනිසංස දෙකක් ලියන්න.

vii. 'අනුන්ගේ සිත දැන ගැනීමට හැකි නුවණ' බුදු දහමෙහි දක්වා ඇත්තේ කවර නමකින් ද?

viii. බුදුරජාණන් වහන්සේ 'අරහං' බුදුගුණය කවියෙන් ලියා ඇති ග්‍රන්ථය කුමක් ද?

ix. බුදුසසුනේ සිව්වණක් පිරිස නම් කරන්න.

x. සිතින් සිදුවන අකුසල කර්ම කීයද? ඒවා නම් කරන්න.

(ලකුණු 02 × 10 = 20)

(02) i. පුද්ගලයෙකුගේ යසස වැඩීමට හේතු වන කරුණු අවධාරණය කරමින් දේශනා කළ ධම්ම පද ගාථාව ලියන්න. (ලකුණු 02)

ii. එම ගාථාවේ අදහස ලියන්න. (ලකුණු 03)

iii. එම ධම්ම පද ගාථාවෙන් ලබා දෙන ආදර්ශ ශිෂ්‍ය ජීවිතය හැඩගස්වා ගැනීමට ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) i. සදිසාවන්ගෙන් ඔබ කැමති දිසා දෙකක් ඊට අදාළ සමාජ කණ්ඩායම් නියෝජනය වන පරිදි ගළපා ලියන්න. (ලකුණු 02)

ii. ශිෂ්‍යයෙක් වශයෙන් ගුරු භවතුන්ට ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් පහ පිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 03)

iii. යහපත් මව්පිය, දූ දරු සබඳතාවක් ගොඩනැගීම සඳහා සිගාලෝවාද සූත්‍රයේ උපදෙස් අගය කරන්න. (ලකුණු 05)

(04) i. ධර්ම සංගායනාවක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

ii. සිව්වන ථේරවාදී සංගිතිය සහ කණිෂ්ක ධර්ම සංගිතිය පැවැත්වීමට හේතු දෙක බැගින් ලියන්න. (ලකුණු 03)

iii. අලුවිහාර සංගායනාව හෙවත් සිව්වන සංගායනාව ශාසනික වශයෙන් වැදගත් වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(05) i. ස්තූප ගොඩනැංවීමේ දී අනුගමනය කෙරෙන මූලික ආකෘති හයෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ස්තූපයක ආකෘතියක් ඇඳ එහි අංග නම් කරන්න. (ලකුණු 03)

iii. ලොවක් මවිතයට පත් කරවන විවිධ කලා නිර්මාණවලින් පොහොසත් මෙම පින් බිමේ පිහිටි පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම ශ්‍රී ලාංකික අප සියලු දෙනාගේම යුතුකමක් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) i. බුද්ධ චරිතය පදනම් කර ගෙන පොළොන්නරු යුගයේ රචිත සාහිත්‍ය කෘති දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. 'සඳකඩපහණ අගනා කලා කෘතියකි.' අනුරාධපුර බිසෝ මාළිගයේ ඇති සඳකඩපහණ ඇසුරින් ඒ පිළිබඳ විග්‍රහයක් කරන්න. (ලකුණු 03)

iii. පුද්ගලයාගේ සදාචාර සංවර්ධනයට බෞද්ධ සිතුවම් කලාව ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) i. යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා බුදුන් වහන්සේ දේශනා කළ සූත්‍රය කුමක් ද? (ලකුණු 02)

ii. දැහැමි රාජ්‍ය පාලනයක් සඳහා පෙන්වා දී ඇති බෞද්ධ ඉගැන්වීම් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. ''සප්ත අපරිහානීය ධර්ම'' යහපත් පාලන රටාවක් ඇති කිරීමට උපයෝගී වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

The National e-learning Portal for The General Education

**පිළිතුරු පත්‍රය - I පත්‍රය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(3) | 3 -(4) | 4 -(4) | 5 -(2) | 6 -(1) | 7 -(2) | 8 -(3) | 9 -(1) | 10 -(2) |
| 11-(3) | 12 -(1) | 13 -(2) | 14 -(2) | 15 -(3) | 16 -(4) | 17 -(1) | 18 -(4) | 19 -(3) | 20 -(2) |
| 21-(4) | 22 -(4) | 23 -(2) | 24 -(4) | 25 -(1) | 26 -(2) | 27 -(3) | 28 -(4) | 29 -(4) | 30 -(3) |
| 31-(2) | 32 -(3) | 33 -(1) | 34 -(3) | 35 -(4) | 36 -(3) | 37 -(4) | 38 -(1) | 39 -(2) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

**II පත්‍රය**

(01) i. වේළුවනාරාමය, බිම්බිසාර රජතුමා (එක් නම් කිරීමකට ලකුණු 01 බැගින් ලකුණු කරන්න.) (ල.02) ii. පෙරදිග මව්පියෝ / දකුණු දිග ගුරුවරු (ල.02) iii. ● රාග, දෝෂ, මෝහ සම්පූර්ණයෙන් නැති කිරීම. ● තණ්හාවෙන් මිදීම ● කෙලෙස් නිවීම (ල.02) iv. කුසල් දම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාවයි. (ල.02) v. අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලීම. (ල.02) vi. ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු දෙන්න. (ල.02) vii. ● පරචිත්ත විජානන ඥානය ● පරචිත්ත විජානනය (ල.02) viii. බුදුගුණාලංකාරය (ල.02) ix. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා (ල.02) x. 03 යි. ● අභිධ්‍යාව (දැඩි ලෝභය, මසුරු බව) ● ව්‍යාපාදය (තරහව) ● මිත්‍යාදෘෂ්ටිය (වැරදි දැකීම, වැරදි වැටහීම) (ල.02)

(02) i. ● උට්ඨානවතෝ සතිමතෝ ● සුචිකම්මස්ස නිසම්මකාරිනෝ ● සඤ්ඤතස්ස ච ධම්ම ජීවිතෝ ● අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති (ල.02) ii. උට්ඨාන වීර්යයෙන් යුත්, මනා සිහියෙන් යුත්, පිරිසිදු ක්‍රියා ඇති, විමසා බලා කටයුතු කරන, මනා හික්මීමක් ඇති, දැහැමින් ජීවත්වන, නොපමාවූවන්ගේ යසස වැඩේ. (ල.03) iii. ඕනෑම පුද්ගලයෙකුගේ යසස කීර්තිය වැඩි දියුණු වීමට ඉවහල් වන කරුණු හතක් (07) මෙම ගාථාවෙන් අවධාරණය කෙරේ. විශේෂයෙන් ශිෂ්‍ය ජීවිතයේ හැඩගස්වා ගැනීමේ දී එකී කරුණු ඉවහල් වේ. නොපසුබට උත්සාහවන්තභාවය හෙවත් උට්ඨාන වීර්යය, මනා සිහි කල්පනාවෙන් යුක්තවීම හෙවත් ස්මෘතිය, පිරිසිදු ක්‍රියා ඇති බව, විමසා බලා කටයුතු කරන බව, මනා සංවරය හෙවත් හික්මීම, ධාර්මිකව ජීවත් වීම, අප්‍රමාදීව කටයුතු කිරීම තුළින් ශිෂ්‍ය ජීවිතය සාර්ථකත්වයට පත් කරගත හැකිය. මෙම ගාථාවෙන් ඉදිරිපත් කරන කරුණු පිළිපැදීමෙන් ශිෂ්‍යයෙකුට නව අරමුණු සාක්ෂාත් කරගෙන අනාගත ජීවිතය සාර්ථකත්වයට පත් කරගත හැකිය. එසේම එම කරුණු අනුගමනය කරන ශිෂ්‍යයාගේ කීර්තිය දස දෙස පැතිරේ. (ආදී වශයෙන් ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න.) (ල.05)

(03) i. 1. පෙරදිග / නැගෙනහිර දිසාව මව්පියන් හා දූ දරුවන් 2. දකුණු දිසාව ගුරුභවතුන් හා සිසුදරුවන් 3. බටහිර දිසාව අඹු දරුවන් 4. උතුරු දිසාව හිත මිතුරන් 5. යට දිසාව ස්වාමි සේවකයන් 6. උඩ දිසාව පැවිදි උතුමන්, මෙයින් දිසා දෙකක් අදාළ සමාජ කණ්ඩායම් හා ගලපා තිබිය යුතු වේ. (ල.02) ii. 1. දුටු විට හුනස්නෙන් නැගිටීම. 2. අවශ්‍ය උපස්ථාන කිරීම. 3. අවවාද අනුශාසනාවලට මැනවින් ඇහුම්කන් දීම. 4. අවශ්‍ය කටයුතු ඉටු කරදීම. 5. මැනවින් ඉගෙන ගැනීම. (ල.03) iii. මව්පියන් හා දූ දරුවන් සතු යුතුකම් දක්වා ඔවුනොවුන් අතර සබඳතාව තහවුරු කර ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල.05)

(04) i. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා පනවන ලද විනය භික්ෂූන් වහන්සේලා එක් වී සාජ්ඣායනා කිරීම. (ල.02) ii. පෙළපොතේ පිටු අංක 103 105 බලන්න. (ල.03) iii. අලුවිහාර සංගායනාව හෙවත් සිව්වන සංගායනාව ශාසනික වශයෙන් වැදගත්වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. මේ සඳහා ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල.05)

(05) i. 1. ඝණ්ටාකාර 2. ඝටාකාර 3. බුබ්බුලාකාර 4. ධාන්‍යාකාර 5. පද්මාකාර 6. ආමලකාකාර (මෙම ආකෘති හයෙන් දෙකක් ලියා ඇත්නම් ලකුණු 02 ක් දෙන්න) ii. පෙළ පොතේ පිටු අංක 110 බලන්න. (ස්තූපාංග හයම ලකුණු

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

කර තිබේ නම් පමණක් ලකුණු 03 ක් දෙන්න.) (ල.03) iii. පෙළ පොතේ පිටු අංක 114 116 බලන්න. (එම පිටුවල ඇති කරුණු අදාළ කරගෙන ලියා ඇති පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න.) (ල.05)

(06) i. අමාවතුර, ධර්ම ප්‍රදීපිකාව, බුත්සරණ, මුවදෙව්දාවත හා සසදාවත (ල.02) ii. ගිනිදූල්, සත්ව රූප (ඇතා, අශ්වයා, ගවයා, සිංහයා) සංකීර්ණ ලියවැල, හංස පෙළ, සරල ලියවැල හා මැද නෙළුම දක්වා වියතුන්ගේ අදහස් සමග ඉදිරිපත් කළ සරල පිළිතුරකට වුව ද ලකුණු දෙන්න. (ල.03) iii. ලියාඇති පිළිතුර සලකා බලා ලකුණු දෙන්න. (ල.05)

(07) i. දීඝ නිකායේ චක්කවත්තී සීහනාද සූත්‍රය (සූත්‍රයේ නම පමණක් ලියා තිබුණ ද ලකුණු දෙන්න.) (ල.02) ii. • දස සක්විතිවත් • සප්ත අපරිහානීය ධර්ම • සතර සංග්‍රහ වස්තු • සතර අගතියෙන් තොරවීම (ල.03) iii. නිතර නිතර රැස්වීම, සමගිව රැස්ව, සමගිව සාකච්ඡා කොට, සමගිව විසිර යාම ආදී වශයෙන් සප්ත අපරිහානීය ධර්ම සියල්ලම හෝ කිහිපයක් ලියා ඒවා යහපත් පාලන රටාවක් ඇති කිරීමට හේතු වන ආකාරය පැහැදිලි කර ලියා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (පෙළ පොතේ පිටු අංක 126 127) (ල.05)

The National e-learning Portal for The General Education